පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - **492**
ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද
වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර
අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீடு தொடர் எண் - **492**
காலி மாவட்ட உள்ளூராட்சி நிறுவனங்கள்

பாராளுமன்றத்தின் அரசாங்க கணக்காளர்கள் குழு சமர்ப்பித்த அறிக்கைகள்
தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ்
நிறுவனங்களுக்குப் பொறுப்பான அமைச்சர் மேற்கொண்ட அவதானிப்பு
மற்றும் நடவடிக்கைகளை பாராளுமன்றத்தில் சமர்ப்பித்தல்.

Parliamentry Publication Series No. - 492
Local Government Institutions of Galle District

Presenting to the Parliament the observations and action taken by the Minister in charge of Institutions under Standing Order No.119(4) regarding the reports tabled by the Government Accounts Committee of the Parliament.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 492

ආයතනයේ නම: ගාල්ල මහා නගර සභාව

රජයේ ගිණුම් කාරක සභාව විසින් කාර්යය සාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස: 65.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂයට යටත්ව මට්ටමේ විගණන මතයක් ලැබී ඇත.
හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	යාවත්කාලීන කිරීමට කටයුතු යොදා ඇත.
උප පත්‍රිකා පොත් ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.
වීපී පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	වීපී පහන් ඉන්වෙන්ට්‍රි ගත කිරීම සිදුකරන අතර ඒ අනුව වීපී පහන් ලේඛනය සකස් කරමින් පවතී.
මිනුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මිනුම් පොතක් ලෙස භාවිතා නොකරන අතර නව තාක්ෂණය භාවිතා කරමින් අදාල මිනුම් පරිගණකගත කර ඇත.
මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කරමින් පවතී.
ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ඉදිකිරීම් ද්‍රව්‍ය ඇතුලු සියලුම ගබඩා තොග අයිතම සඳහා බින් කාඩ්පත් පවත්වාගෙන යනු ලබයි.
සභාව විසින් වියදම් සීමාවන් නිරණය කර නගරාධිපතිවරයා / සභාපතිවරයා සහ නිලධාරීන් වෙත පැවරීමක් සිදු කර නොතිබුණි.	බලතල පැවරීමට ඉදිරියේදී කටයුතු කිරීම සිදු කරනු ලබයි.
මුදල් රෙගුලාසි පරිදි ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නාතිබුණි.	2024 වර්ෂයේ සිට සිදු කර ඇත.
මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර නොතිබුණි.	
මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම ප්‍රමාණවත් තරම් පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි.	
ප්‍රධාන සංයුත සැලැස්ම පිලියෙල කර නොතිබුණි.	සකස් කිරීමට කටයුතු කරමි.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයා නොතිබුණි.	විගණන විමසුම් සඳහා පිළිතුරු යොමුකරමින් පවතී.
විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	වර්ෂය ආරම්භයේදී අභ්‍යන්තර විගණන වැඩසටහන අනුමැතියට යොමු කර ඇත.

සුනිල් ගමගේ
නගරාධිපති
ගාල්ල මහා නගර සභාව

සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	ගාල්ල මහ නගර සභාවට අයත් වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීමට අදාල ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
පවරා නොගත් වත්කම් තිබුණි.	පවරා නොගත් ඉඩම් හා ගොඩනැගිලි වලට අදාලව හිමිකම් සහතික සඳහා ප්‍රා.ලේ කාර්යාලය මගින් ඉල්ලීම් කරමින් පවතී.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහනක් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මෙම අඩුපාඩුව වර්තමානය වනවිට නිවැරදි කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	ගර්හිත වාහනවල ලියාපදිංචි සහතික අවලංගු කිරීම සඳහා අදාළ ලියවිලි මෝටර් රථ දෙපාර්තමේන්තුව වෙත 2026.05.29 දින භාර දී ඇත.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මූ.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	මූ.රෙ. පරීක්ෂණ සිදු කරන නිලධාරීන් දැනුවත් කර ඇති අතර එක් මූ.රෙ. පරීක්ෂණ වාර්තාවක් ලැබී ඇත.
වර්ෂයට අදාළව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	හිඟ ආදායම අය කිරීමට කටයුතු කරමින් පවතී.
ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දිය යුතු සභාවේ දේපළ සමාලෝචිත වර්ෂය තුළදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබුණි.	ලංසු ඉදිරිපත් නොවූ පරිශ්‍රයන් හැර සියලුම පරිශ්‍රයන් බදු දී ඇත. නැවත බදු දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
දීර්ඝ කාලීනව බදු දිය යුතු දේපළ සමහරක් එසේ බදු නොදුන් අවස්ථා විය.	බදු අය කිරීමට සියලු ක්‍රියාමාර්ග ගන්නා අතර එසේ නොවන අවස්ථාවන්හිදී මහ නගර සභා ආඥාපනත අනුව කටයුතු කරමි.

සුනිල් ගමගේ
නගරාධිපති
මහ නගර සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 492

ආයතනයේ නම: ගාල්ල මහා නගර සභාව

දෙවන කොටස: 30.00	
තොරතුරු නිලධාරියා / නිලධාරීන් නම් කළ නිලධාරියා (අභියාචනා නිලධාරියා) පිළිබඳ දත්ත මහජනතාවට ප්‍රදර්ශනය කර නොතිබුණි.	ප්‍රදර්ශනය කර ඇත.
සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.	ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරමි.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	අවස්ථාව සලසා දී ඇත.
ආයතනය තම විෂය පථය අනුව තීරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	ක්‍රියාකාරී සැලැස්ම සඳහා හඳුනාගෙන ඇත.
හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟාකරගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	ඉදිරියේදී කටයුතු කරමි.
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	ඉදිරියේදී කටයුතු කරමි.
ජාතික ප්‍රතිපත්ති වලට අනුකූලව කසල කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි.	කසළ කළමනාකරණ පස් අවුරුදු සැලැස්මක් සකස් කර ඇත.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩපිළිවෙලක් නොතිබුණි.	වරින් වර පවත්වන කසල පොල වැඩසටහන් මගින් E – WESTE ඉවත් කිරීම සිදු කරනු ලබයි.
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	කොන්දේසි සපුරා ඇති ආයතන වෙත පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර ඇත. අඩුපාඩු පවතින ආයතනවලට කොන්දේසි සපුරා ගැනීමට දැනුවත් කර ඇත.
අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.
අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	පුස්තකාල වෙත ලබා දී අවස්ථාව සලසා දී ඇත..
ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරමි.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.	පිළියෙල කර ඇත.



සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	කාර්ය මණ්ඩලය පුහුණු අවස්ථාවන් සඳහා යොමු කරනු ලබයි.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	2/2018 (i) අනුව ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවන බව දන්වා ඇත.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	නිලධාරියෙකු නම් කර ඇත.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	කළමනාකරණ සේවයේ පුරප්පාඩු සඳහා සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර ඇත.
කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර නොතිබුණි.	ලිඛිත කාර්ය පැවරුම් ලබා දී ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	අවශ්‍යතාවය අනුව නිලධාරීන් පුහුණු අවස්ථාවන් සඳහා යොදවනු ලබයි.
විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	වාර්ෂික කාර්ය සාධන වාර්තාවට ඇතුලත් කර ඇත.

නගරාධිපති
මහා නගර සභාව
ගාල්ල

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම : හික්කඩුව නගර සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස 80.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂයට අදාළව තත්ත්වාගණනය කළ මතයක් ලැබී ඇති බව කාරුණිකව සඳහන් කරමි.
වීථි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	හික්කඩුව නගර සභා බල ප්‍රදේශයේ වීථි පහන් ඉතා විශාල ප්‍රමාණයක් දැනට ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. මේ වන විට මාර්ග ඉන්ජිනේරුවරිය හරහා වීථි පහන් පද්ධතියට ඇතුළත් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.
ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ ඇස්තමේන්තු ලෙජරය සකස් කර නොතිබුණු අතර මේ වනවිට එම ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යන බව කාරුණිකව සඳහන් කරමි.
ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලේඛණයක් පැවති අතර, එය ඉදිරියට යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබන බවට කාරුණිකව දන්වා සිටිමි.
ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මෙතෙක් ගල් හා බොරලු සඳහා ලේඛණයක් පවත්වාගෙන ගොස් නොමැති අතර අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය සටහන් කරන ලද ලේඛනයේම ගල් බොරලු පිළිබඳව ද සටහන් කරන ලදි. මේ වන විට ගල් බොරලු ලේඛණයක් සකස්කර නිසි පරිදි පවත්වාගෙන යන බව කාරුණිකව දන්වමි.
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.	ප්‍රධාන සංයුත සැලැස්ම සකස් කිරීම සඳහා මේ වන විට මූලික පියවර තබා ඇති බව සඳහන් කරමි.
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණ කර නොතිබුණි.	හික්කඩුව නගර සභාවට අයත් නිකොලිනා මාර්ග තලනය සහ බෙබ් ලෝඩරය චෙන්දේසි කිරීමට නිර්දේශ ලැබී ඇත. එම වාහන සඳහා තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කර ඇති අතර එය ලද විගස එම වාහන චෙන්දේසි කිරීමට කටයුතු කරමි. තවද ට්‍රැක්ටර් රථ දෙකක ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා මෝටර් රථ දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව ඉල්ලීම් කර ඇති අතර ඒ සඳහා මේ වන විටත් අනුමැතිය ලැබී නොමැත. නැවතත් සිහිකැඳවීමක් සිදු කර ඉදිරි කටයුතු කරන බව කාරුණිකව දන්වමි.
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේ නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ නිරවුල් කර නොතිබුණ අතර නියමිත දිනට පිළියෙළ කර සහතික කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කරන බව කාරුණිකව දැනුම් දෙමු

එම්.ඩබ්.රංජන රංග කුමාර
උප සභාපති
හික්කඩුව නගර සභාව

බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	2023 වර්ෂයේ මු.රෙ ප්‍රකාරව කටයුතු කිරීමට අපොහොසත් වුවද, වර්ථමානයේදී බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කිරීමෙන් පසු නිරවුල් කිරීමට කටයුතු කරයි.
වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	2020 සිට 2022 දක්වා කාලය තුළ පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය සහ ඒ හා බැඳුණු දැඩි ආර්ථික අර්බුදය හේතුවෙන් ජනතාවගේ ජීවනෝපාය මාර්ග ඇහිරී ගිය අතර, ඔවුන්ගේ ප්‍රමුඛතාවය වූයේ මූලික දෛනික අවශ්‍යතා සපුරා ගැනීමයි. මේ හේතුවෙන් වරිපනම් ගෙවීම කෙරෙහි ජනතාව තුළ පැවති උනන්දුව හීන විය. තවද , සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද සහ සංචරණ සීමා හේතුවෙන් නිලධාරීන්ට ක්ෂේත්‍රයේ ගොස් හිඟ වරිපනම් අය කර ගැනීමට නොහැකි වීම, ජංගම සේවා ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම. මෙහි ප්‍රතිඵලයක් ලෙස වරිපනම් අය කර ගැනීමේ ප්‍රතිශතය පහළ මට්ටමක පැවති අතර, එම කාල සීමාවේ නොගෙවූ බදු මුදල් 2023 වර්ෂය ආරම්භයේදී විශාල හිඟ ශේෂයක් ලෙස වාර්තා විය. 2023 වර්ෂයේදී පෙර වර්ෂවලට වඩා වැඩි බදු මුදලක් අය කර ගැනීමට හැකි වුවද, පැවති විශාල ආරම්භක හිඟ ශේෂය හමුවේ එය සමස්තයක් ලෙස අඩු ප්‍රතිශතයක් ලෙස සටහන් විය. කෙසේ වෙතත්, 2024 වර්ෂයේදී උදා වූ සාපේක්ෂ යහපත් ආර්ථික වටපිටාව තුළ ආදායම් ඉහළ නංවා ගැනීම සඳහා සභාව විසින් පහත දැක්වෙන විශේෂ ක්‍රියාමාර්ග ගන්නා ලදී. 01. රුපියල් 5,000කට වඩා වැඩි හිඟ වරිපනම් සහිත සෑම දේපළක් සඳහාම 2024 තක්සේරු දැන්වීම් සමඟ විශේෂ හිඟ වරිපනම් නිවේදන නිකුත් කිරීම. 02. සෑම මසකම දෙවනාවක් අඛණ්ඩව ජංගම සේවා පවත්වා බදු ගෙවන්නන් වෙත සමීප වීම. මෙම උපායමාර්ගික පියවරයන් හේතුවෙන් 2024 වර්ෂය අවසානයේදී අයකර ගත් හිඟ වරිපනම් ආදායම රුපියල් 48,906,916.02 දක්වා ඉහළ නංවා ගැනීමටත්, එය පෙර වර්ෂවලට සාපේක්ෂව සැලකිය යුතු ඉහළ ප්‍රතිශතයක් ලෙස පවත්වා ගැනීමටත් සභාව සමත් විය. 2024 වර්ෂයේ අනුගමනය කළ සාර්ථක ක්‍රමවේදයන් 2025 වර්ෂයේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හේතුවෙන් වරිපනම් බදු හිඟ ආදායමෙන් අයකරගත් ප්‍රතිශතය 34% දක්වා තවදුරටත් වර්ධනය වී ඇත.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා අයවිය යුතු සියලු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබුණි.	හික්කඩුව වනජීවී කාර්යාලය අසළ (සමූපාකාරය අසළ) වැසිකිළි පද්ධතියේ 2023 වර්ෂයට අදාල ටෙන්ඩර් කාල සීමාව 2023.04.04 දින සිට 2024.04.03 දක්වා වූ අතර, ඊට අදාල සියළු වාරික

එම්.ඩබ්.රංජන රංග කුමාර
උප සභාපති
හික්කඩුව නගර සභාව

	මුදල් නිසි පරිදි ගෙවා අවසන් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
හිඟ හිටි බදු කුලී අයකර ගැනීම සම්බන්ධව අදාළ ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	හිඟ බදු කුලී සම්බන්ධයෙන් අවස්ථා ගණනකදී ලිපි යොමු කර ඇත. අවුරුදු 03කට වඩා වැඩි හිඟ කඩකුලී ඇති අය සම්බන්ධයෙන්ද නෛතික ක්‍රියාමාර්ග ගනිමින් කටයුතු කර ඇත. හික්කඩුව පොදු වෙළඳපොල කඩ කාමර අංක 52 සිට 63 දක්වා (ටෙන්ඩර් කිරීමේදී අංක 09 සිට 19 දක්වා ලෙස සටහන් කර ඇත) වූ කඩ දිගු කාලයක් භාවිතා නොකර තිබූ හෙයින් හා හිඟ කඩ කුලී පැවතීම නිසා 2024.03.21 දින විවෘත ටෙන්ඩරයක් හරහා සාර්ථක ලංසුකරුට මෙම කඩ කාමර 11 ලබා දී ඇත. එම සාර්ථක ලංසුකරු 2024.05.30 දිනැතිව නිවැරදිව ගිවිසුම්ගත වී මාසිකව කඩකුලී ගෙවීම සිදු කරයි. තවද හික්කඩුව පොදු වෙළඳපොල කඩ අංක 09 ද ටෙන්ඩර් කර ඇත. හික්කඩුව පොදු වෙළඳපොල මාලු කඩ 07 හා 08 කාලයක් තිස්සේ කඩකුලී නොගෙවීම මත නැවත සභාවට පවරා ගෙන 2025 ඔක්තොම්බර් මාසයේදී ටෙන්ඩර් කර ඇති අතර එහිදී සාර්ථක ලංසුකරු එම කඩ කාමර ප්‍රතික්ෂේප කර ඇත. නැවතත් මෙම අංක 07 හා 08 යන මාළු කඩ කාමර 2026.01.29 දින ටෙන්ඩර් කර ඇත. එහිදී සාර්ථක ලංසුකරු අදාළ මුදල් ගෙවා ගිවිසුම් ගත වන ලෙස දන්වා ඇත. දිගු කාලීනව හිඟ කඩ කුලී ඇති කඩ සම්බන්ධයෙන් සභාවට පවරා ගෙන ටෙන්ඩර් කර සාර්ථක ලංසුකරුවන්ට ලබා දී ඇත. තවද කාලයක් තිස්සේ ටෙන්ඩර් නොකර පැවති කඩ කාමර 09ද ටෙන්ඩර් කර ඇත. කෙටිකාලීන හිඟ කඩ කුලී අය කර ගැනීම සඳහා ආදායම් පරීක්ෂක නිලධාරීන් හරහා දැනුවත් කිරීමෙන්ද, ලිපි යොමු කිරීම මඟින්ද දැන්වත් කරමින් කඩ කුලී අය කර ගැනීමට කටයුතු කරමින් සිටී.

එම්.ඩබ්.රංජන රංග කුමාර
උප සභාපති
හික්කඩුව නගර සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම : හික්කඩුව නගර සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
දෙවන කොටස : 39.50	
තොරතුරු නිලධාරියා/ නිලධාරීන් සහ නම් කළ නිලධාරියා (අභියාචන නිලධාරියා) පිළිබඳ දත්ත මහජනතාවට ප්‍රදර්ශනය කර නොතිබුණි.	තොරතුරු නිලධාරියා නගර සභාවේ ලේකම් වන අතර නම් කළ නිලධාරියා ගරු සභාපතිතුමා වේ. මේ වන විට එය ප්‍රදර්ශනය කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මේ වන විට මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් සහ මුහුණු පොත හරහා අවස්ථාව සලසා ඇති බව කාරුණිකව සඳහන් කරමි. www.hikkaduwa.uc.gov.lk
ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	මහජනයාට පැමිණිලි හා ප්‍රශංසා සටහන් කිරීම සඳහා වෙබ් අඩවිය සහ මුහුණු පොත හරහා අවස්ථාව සලසා ඇති බව කාරුණිකව සඳහන් කරමි. www.hikkaduwa.uc.gov.lk
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	මේ වන විට තිරසර සංඅවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර ඇත.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි.	අවසන් වරට 2025 වර්ෂ අවසානයේදී නගර සභාවේ ප්‍රචාරක අංශය මඟින් ප්‍රචාරණයක් සිදුකර නගර සභා බල සීමාව තුළ පවතින ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස්කර එම අපද්‍රව්‍ය ලබාගන්නා ආයතනයක් වෙත භාර දෙන ලදි.
කසල අපහරණය කිරීම/ කසල කළමනාකරණය කිරීම සඳහා සභාව විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි.	දැනට එක්රැස් වන කසල දෙනිකව කලාප දෙකකින් යුක්තව දිරන නොදිරන ලෙස වෙන් කර දිරන කසල මුදල් ගෙවා මොන්රෝවියාවත්තට ලබා දීම විධිමත් පරිදි සිදු කරනු ලබයි. හික්කඩුව නගර සභාව වර්ග කි.මී 12 කින් යුත් සංචාරක පුරවරයක් බැවින් දෙනිකව විශාල ප්‍රමාණයක් කසල එක් රැස් වේ. කසල ප්‍රමාණයෙන් වැඩි බැවින් කසල ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා සුදුසු ප්‍රමාණවත් ඉඩමක් නොමැති බව කාරුණිකව සඳහන් කරමි. තවද මේ වන විට නොදිරන කසල වලමුල්ලේ පිහිටි කසල බේල් කිරීමේ මධ්‍යස්ථානය වෙත භාර දෙනු ලැබේ.
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	2026 .01.01 දින සිට කසල බද්ද අය කිරීම සඳහා 2026.01.02 දින අංක 2470 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද බවත් ඒ අනුව කසල බදු අය කිරීමට කටයුතු කරන බවත් සඳහන් කරමි.
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/ නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	පළාත් සභාව විසින් සකස් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව වැලඳගත් හෙයින් අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීමට මේ වන තෙක් අවශ්‍යතා හට ගෙන නොමැති බව කාරුණිකව සඳහන් කරමි.

ඩබ්.ඩබ්.රංජන රංග කුමාර
උප සභාපති
හික්කඩුව නගර සභාව

අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	මේ වන විට කාර්යාලයේ හා පුස්තකාල වල අතුරු ව්‍යවස්ථාවේ පිටපත් තබා මහජනතාවට පරිශීලනයට ඉඩ ප්‍රස්ථාව ලබා දී ඇති බව කාරුණිකව සඳහන් කරමි.
ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	මහජනතාවගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආයතනය ඉදිරිපස බහාලුම් පෙට්ටියක් සකස් කර ඇති අතර ඒ තුළින් ඇගයීම සිදු කරයි.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මේ වනවිට මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර ඇති බව කාරුණිකව දන්වමි.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්යමණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	මේ වනවිට මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඇති බව කාරුණිකව දන්වමි.
සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුළත්ව කාර්යය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	2024 වර්ෂය සඳහා කාර්යය සාධන ගිවිසුම් සකස් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනා ගෙන නොතිබුණි.	ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක හඳුනා ගැනීමට මූලික පියවර තබා ඇති බව කාරුණිකව සඳහන් කරමි.
අය කළ යුතු අධිභාර අය කර නොතිබුණි.	2023 වර්ෂයට අදාළව පුසතකාල පොත් සඳහා අධිභාර මේ වනවිට අයකර ගෙන ඇත.

එම්.ඩබ්.රංජන රංග කුමාර
උප සභාපති
හික්කඩුව නගර සභාව

පාර්ලිමේන්තු ප්‍රශ්න මාලා අංකය - 492

ආයතනයේ නම : නගර සභාව - අම්බලන්ගොඩ.

පළමු කොටස

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාවෙන් දක්වා ඇති පවත්නා දුර්වලතා	ආයතනය ගත් ක්‍රියා මාර්ග / වර්තමාන තත්වය
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ මතයකි. නිලධාරීන් දැනුවත් කර ඇත.2024 වර්ෂය සඳහා තත්වාගණන කළ මතයක් ලබා දී ඇත. විගණන විමසුම් නිවැරදි කිරීම සඳහා අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත.2026 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හිතකර විගණන මතයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත
ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත් කාලීනව පවත්වා නොතිබුණි	මේ පිළිබඳ අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. 2023 වසරේ සිට යාවත්කාලීනව පවත්වා ගෙන යයි.
ගල් බොරලු ලේඛනය නිසි පරිදි යාවත් කාලීනව පවත්වා නොතිබුණි.	මේ පිළිබඳ අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. 2023 වසරේ සිට යාවත්කාලීනව පවත්වා ගෙන යයි.
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	මේ පිළිබඳ අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. අවශ්‍ය පුහුණු වැඩසටහන් වලට නිලධාරීන් යොමු කරන ලදි. 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අංශ අනුව විස්තරාත්මකව සකස් කර ඇත.සංයුක්ත සැලැස්ම තුළ අන්තර්ගත කරුණු හා අරමුණු ඒ අනුව තීරණය කර ඇත.
සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	අදාල උපදෙස් විෂය නිළධාරී හට ලබා දෙන ලදි. 2026 වසරට සකස් කර ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මේ පිළිබඳ අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. සියලු නිලධාරීන් අභ්‍යන්තර විගණන විමසුම් සඳහා අදාළ දිනට පිළිතුරු සැපයීමට සිදු කරයි.
මු.රෙ ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	නිවැරදි කිරීම සිදු කර ඇත. 2023 වසරේ සිට විගණකාධිපතිවරයා වෙත යොමු කිරීමට කටයුතු කරනු ලබයි.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4ක් පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ පෙබරවාරි, ජූලි ඔක්තෝම්බර්,දෙසැම්බර් යන මාසයන් වල පවත්වා ඇත.2023 වර්ෂයේ සිට චක්‍රලේඛ ප්‍රකාරව කමිටු 04ක් පවත්වාගෙන යනු ලබයි.
සියලු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	සියලු වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කරමින් පවති.
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	අදාළ අංශ දැනුවත් කර ඇත.2025.03.21.දින වෙන්දේසි කර විකුණාඇත. ට්‍රැක්ටරය (37ශ්‍රී1877) - රු.26,200.00 ත්‍රිරෝදරථය (GC-8213) - රු.25,100.00 ට්‍රැක්ටරය(SF-1521)-රු.9,200.00

අසේල ගොඩහේවා
සභාපති
නගර සභාව
අම්බලන්ගොඩ

	82663 හා 82668 අංක දරණ ලදුපත් මගින් මුදල් අයකර ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශනවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	එම විෂය නිලධාරින් දැනුවත් කරන ලදි .2023 වසරේ සිට යාවත්කාලීන ව පවත්වාගෙන යනු ලබයි.
වර්ෂයට අදාළ බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	ආදායම් රැස්කිරීම සඳහා ජංගම සේවා කිරීම රතු නිවේදන යැවීම සිදු කිරීම.බිල් කළ ආදායමෙන් අය කිරීම මධ්‍යස්ථ මට්ටමකට ළඟා වී ඇත.

දෙවන කොටස

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාවෙන් දක්වා ඇති පවත්නා දුර්වලතා	ආයතනය ගත් ක්‍රියා මාර්ග / වර්තමාන තත්වය
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනතාවට පැමිණිලි හෝ ප්‍රංශසා සටහන් කිරීම සඳහා අවස්ථා ව සලසා දී නොතිබුණි.	වෙබ් අඩවිය මඟින් ජනතා ගැටලු ඉදිරිපත් කිරීමට අවකාශය සලසා දෙන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදි. මේ වන විට වෙබ් අඩවිය ක්‍රියාත්මක තත්වයේ පැවතිය ද ජනතා ගැටලු ඉදිරිපත් කළ නොහැක .නමුත් E-SABA APPමගින් මහජන පැමිණිලි ලබා ගැනීම සිදු කරයි
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාක්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	ආයතනයේ වාර්ෂික සැලැස්ම පිලියෙල කිරීමේදි තීරසර අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක ස්ථාපිත කරන ලෙස අදාල නිලධාරියාට දැනුම් දී ඇත. දර්ශක නියම කර ඇත.
කසළ අපහරණය කිරීම/කසල කළමනාකරණය කිරීම සඳහා සහාව විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.	දිරන නොදිරන ලෙස කසළ වර්ගීකරණය කර ලබා ගෙන කසළ කළමණාකරණය විධිමත් කරන මෙන් අදාළ අංශ දැනුවත් කරන ලදි මේ පිළිබඳ අදාල නිලධාරින් දැනුවත් කරන ලදි. 2023 වසරේ සිට නොදිරන කසල පුද්ගලික අංශය වෙත අලෙවි කිරීමටත්,පොලිතින් මොන්රෝවියාවත්ත සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය වෙත ලබා දීමක් සිදු කරයි.
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගතයුතු සියලු ආයතන පරිසර බලපත්‍රලබාගෙන නොතිබුණි	පරිසර බලපත්‍ර ලබාගතයුතු ආයතන මේ පිළිබඳ දැනුවත් කරන ලදි.එවැනි ආයතන කිහිපයක් මේ වනවිට බලපත්‍ර ලබා ගැනීම සඳහා යොමු වී ඇති අතර ඉදරියේ දී තවත් ආයතන මේ සඳහා යොමු කර ගැනීමට කටයුතුකරමින් සිටියි.
අතුරු ව්‍යවස්ථා පරීශීලනය කිරීම සඳහා මහජනයාට ප්‍රවේශයක් සලසා දී නොතිබිණි.	අදාළ නිලධාරින් දැනුවත් කර ඇත. 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධි	විෂය නිලධාරියා දැනුවත් කර පුහුණු වැඩසටහන් වලට යොමු කර ඇත. 2024

අසේල ගොඩහේවා
සභාපති
නගර සභාව
අම්බලන්ගොඩ

විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	වර්ෂය සඳහා නිසිපරිදි මානව සම්පත් සැලැස්මක් සකස් කරමින් පවති.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයේ සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	මේ පිළිබඳ අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. පුහුණු අවශ්‍යතාවයන් සඳහා විධිමත් සැලැස්මක් සකස් කරමින් පවති.
අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩලය බඳවා ගෙන තිබිණි.	තොරතුරු ලබා දීමේදි අතපසුවීමක් සිදු වී ඇත. අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීමක් සිදුවී නොමැත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමක පැවතුණි.	මේ පිළිබඳ අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. වර්තමානයේදි නිවැරදි කර ඇත.
විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	ලබා දී ඇති උපදෙස් ක්‍රියාත්මක කරමින් පවති. 2024 වසරේ නිර්දේශ හැත්තෑ දෙකන් 25% ක් පමණ ක්‍රියාත්මක කර ඇත.
අය කළ යුතු අධිභාර අය කර නොතිබුණි.	මේ පිළිබඳ අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. වර්තමානයේදි නිවැරදි කර ඇත.

අසේල ගොඩහේවා
සභාපති
නගර සභාව
අම්බලන්ගොඩ

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - අක්මීමන ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යය සාධන ඇගයීම ප්‍රකාර ව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස - 61.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.
ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය යාවත්කාලීන ව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන ව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
විගණන විමසුම් ලේඛනය/ අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන ව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
වීථි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස් කිරීමෙන් අනතුරු ව වීථි පහන් ලේඛනය යාවත්කාලීන කරමි.
මිනුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන ව පවත්වා නොතිබුණි.	2026 දෙසැම්බර් 31 දිනට පෙර ගැසට් කිරීමට කටයුතු කර ඇති අතර ඒ අනුව මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කරමි.
ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්නා නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	භාවිතා නොවේ.

එම්.එච්.සුගත් ආනන්ද
සභාපති
ප්‍රාදේශීය සභාව
අක්මීමන.

මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	Payroll මෘදුකාංගය පමණක් පවතී.
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	සකස් කරමින් පවතී.
සංයුත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා සභාවට අදාල ව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර කමිටු අනුමැතිය ලබා ඇත.
සංයුත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා සභාවට අදාල ව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර කමිටු අනුමැතිය ලබා ඇත.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රෙල්ඛයේ 13 ඡේදය ප්‍රකාර ව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.
සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනයට අනුමත කර ගෙන නොතිබුණි.	2024 වර්ෂය සඳහා සභාවට අදාල ව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර කමිටු අනුමැතිය ලබා ඇත.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහා ම පිළිතුරු සපයා නොතිබුණි.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහා ම පිළිතුරු සපයා ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	2026 වර්ෂය වන විට නිවැරදි කර ඇත.
මු.රෙ.ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත්.කර නොතිබුණි.	ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	මායම් කණ්ඩු සකස් කර ඇත. මැනුම් තහවුරු කරමින් පවතී.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට නිවැරදි කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	2022.05.09 දින SL 1099 අත් ට්‍රැක්ටරය වෙන්දේසි කර ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන්	නිරවුල් කර ඇත.

එම්.එච්.සුගත් ආනන්ද
සභාපති
ප්‍රාදේශිය සභාව
අක්මීමන.

මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	
නිග වරිපනම් අය කර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුණි.	රතු නිවේදන නිකුත් කර ඇත. දේපල තහනම් කිරීමේ නිලධාරියෙකු බදවා ගැනීම සඳහා නැවතත් අයදුම්පත් කැඳවීමට කටයුතු කර ඇත.
ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දිය යුතු සභාවේ දේපළ සමාලෝචිත වර්ෂය තුලදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබුණි.	2024.06.24 දිනට ටෙන්ඩර් කළ ද කිසිදු අයෙකු ඒ සඳහා ඉදිරිපත් වී නොතිබුණි.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් දේපළ සඳහා එළඹිය යුතු ගිවිසුම් සියල්ල පූර්ණ ලෙස ඉටුකර නොතිබුණි.	ගිවිසුම් යාවත්කාලීන කර ඇත.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා අයවිය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබුණි.	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා අයවිය යුතු සියළු බදු මුදල් මේ වන විට අය කර ගෙන ඇත.
ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදු කර නොතිබුණි.	නඩු පවරා අය කර ගෙන ඇත.

එම්.එච්.සුගත් ආනන්ද
සභාපති
ප්‍රාදේශිය සභාව
අක්මීමන.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - අක්මීමන ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යය සාධන ඇගයීම් ප්‍රකාර ව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
දෙවන කොටස - 59.00	
හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	ළඟා කර ගත යුතු ඉලක්ක මේ වන විට තීරණය කර ඇත.
කසල අපහරණය කිරීම / කසල කළමනාකරණය කිරීම සඳහා සභාව විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.	නොදිරන කසල එක්රැස් කිරීම සඳහා ගොඩනැගිල්ලක් තනා ඇති අතර මිල කළ නොහැකි කසල රත්ගම මොන්රෝවියාවත්ත වෙත ලබා දේ. දිරන කසල සඳහා කොම්පෝස්ට් ව්‍යාපෘතියක් අනුමැතිය සඳහා මහ සභාව වෙත ඉදිරිපත් කර ඇත.
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	කසල බදු ගැසට් කළ නමුත් ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා නොමැති බැවින් අය කිරීමට නොහැකි වී ඇත.
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	සියළු අවශ්‍යතා සම්පූර්ණ කර ඇති ආයතන සඳහා බලපත්‍ර ලබා දී ඇති අතර තවදුරටත් බලපත්‍ර ලබා ගත යුතු ආයතන සඳහා ඊට අදාල කටයුතු සිදු කරමින් පවතී.
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	අතුරු ව්‍යවස්ථා වැළද ගෙන ඇත.

එම්.එච්.සුගත් ආනන්ද
සභාපති
ප්‍රාදේශිය සභාව
අක්මීමන.

ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	සේවාලාභී තෘප්තිය මැන බලනු ලබයි.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	සකස් කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	මේ වන විට නිවැරදි කර ඇත.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	චක්‍රෙල්ඛ ප්‍රකාර ව මේ වන විට අවශ්‍ය නොවේ.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරයෙකු නම් කර නොතිබුණි.	ප්‍රජා සංවර්ධන නිලධාරි පත් කර ඇත.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	වරින් වර සිදු කරන ලද උපාධිධාරීන් බඳවා ගැනීම හා අනියම් ආදේශක සේවකයින් ස්ථීර කිරීම සඳහා නිකුත් කරන ලද චක්‍රෙල්ඛ මත අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩලය බඳවා ගෙන ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ඉල්ලුම් කර ඇති පුහුණු අවශ්‍යතාවලින් 50% ක් සපුරා ඇත.
විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.

එම්.එච්.සුගත් ආනන්ද
සභාපති
ප්‍රාදේශීය සභාව
අක්කීමන.

පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිරීක්ෂණ, නියෝග ලැබී නොමැත.
සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2026 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇත.
වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාල නිලධාරීන් පිළිබඳ ව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධාරියා දැනුවත් කර නොතිබුණි.	දැනුවත් කර ඇත.
අය කළ යුතු අධිභාර අය කර නොතිබුණි.	එක් අධිභාරයක් අය කරන ලදී.

එම්.එච්.සුගත් ආනන්ද
සභාපති
ප්‍රාදේශිය සභාව
අක්මීමන.

පාර්ලිමේන්තු ප්‍රශ්නමාලා අංකය : **492** ආයතනයේ නම : අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව පළමු කොටස : **51.00**	
රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	**ගෙන ඇති ක්‍රියාමාර්ග**
සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කර නොතිබුණි.	පෙබරවාරි 28 දිනට පෙර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ මතය යටත්ව මට්ටමේ/ව්‍යාවත්ත මට්ටමේ/අහිතකර මට්ටමමේ විය.	තත්ත්වාගණනය කළ මතයක් ලැබී ඇත.
හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යයි.
ණයගැති ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුනි.	ණයගැති ලේඛනය යාවත්කාලීන කර ඇත.
විටී පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	විටී පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යයි.
මිනුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුනි.	සියලු ඇස්තමේන්තු සකස් කිරීමේදී මිනුම් වාර්තා සකස් කරනු ලබන අතර ඒවා ඒ ඒ කර්මාන්තයට අදාළව ගොනුවේ පවත්වාගෙන යනු ලැබේ.
මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව යාවත්කාලීනව නොතිබුණි.	මාර්ග ඉන්වෙන්ට්‍රිය දැනට යාවත්කාලීනව පවත්වාගෙන යයි.
ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබිණි.	ඇස්තමේන්තු ලෙජරය ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරමි.
ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව නොතිබිණි.	සෘජු ශ්‍රම ලෙස කර්මාන්ත ඉටුකිරීමේදී ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලේඛනය සකස්



	කිරීමට කටයුතු කරමි. දැනට කොන්ත්‍රාත් පදනම මත කර්මාන්ත ඉටු කරයි.
ගල් හා බොරළු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබිණි.	සෘජු ශ්‍රම ලෙස කර්මාන්ත ඉටුකිරීමේදී ගල් හා බොරළු ලේඛනය සකස් කිරීමට කටයුතු කරමි. දැනට කොන්ත්‍රාත් පදනම මත කර්මාන්ත ඉටු කරයි.
මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කරනොතිබිණි.	මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර තිබිණි.
මාසික වැටුප් ලේඛනය සහ පාලන ගිණුම් තුලනය කර සහ අදාළ සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබිණි.	මාසික වැටුප් ලේඛනය සහ පාලන ගිණුම් තුලනය කර, අදාළ සැසඳුම් ප්‍රකාශ ඉදිරියේදී පිළියෙල කරමි.
මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස්කර නොතිබිණි.	ආයතනයේ පවතින පද්ධති හා මෘදුකාංගවලට අදාළව තුන්මසකට වරක් මුරපද වෙනස් කර ඇත.
ප්‍රධාන සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබිණි.	2023 වර්ෂයට අදාළව සංවර්ධන සැලැස්මක් සකස් කර ඇත.
සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සහ සම්මත කර නොතිබිණි.	2023 සංවර්ධන සැලැස්මට අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර සම්මත කරගෙන ඇත.
සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබිණි.	2024 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්මට අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත.
සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනට අනුමත කරගෙන නොතිබිණි.	2024 වර්ෂයේ සිට ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර, අනුමත කර එය දිගටම සිදු කරගෙන යයි.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයා නොතිබිණි.	සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයා ඇත.

මේජර් ගාමිණී කටුආරච්චි(විශ්‍රාමික)
සභාපති
අම්බලන්ගොඩ ප්‍ර[illegible]ය සභාව

අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.මු.රෙ ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබිණි.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා කිහිපයක් ඇත. අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
සියලු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබිණි.	සියලු වත්කම්වල ආරක්ෂාව තහවුරු කරගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතියි.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබිණි.	දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණනයට ඉදිරිපත් කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 08කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබිණි.	අපහරණයට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් ඇත.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීනව පදනමක් මත පවත්වා නොතිබිණි.	සෑම වාහනයක් සඳහා ම ලොග් පොත් යාවත්කාලීනව පවතියි.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබිණි.	වාහන අනතුරු සිදු වී නොමැත.
සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබිණි.	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.
වර්ෂයට අදාළව බිල් කල ආදායමෙන් අයකිරීම පහළ මට්ටමක විය.	පහළ මට්ටමක පැවති ආදායම් දැනට අයකරගෙන අවසන්ව ඇත.
හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබිණි.	වරිපනම් අය නොකරන බැවින් හිඟ වරිපනම් නොමැත.
ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දිය යුතු සභාවේ දේපල සමාලෝචිත වර්ෂය තුළදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබිණි.	සභාවේ දේපළ ටෙන්ඩර් මත බදු දී නොමැති අතර සතිපොළ බදු සභාව මඟින් එකතු කරයි.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් දේපළ	ටෙන්ඩර් මත බදු දුන් දේපල නොමැති

ලේඛ්‍ය ගාමිණී සාරාකාරවසම්(විද්‍යාර්ථ)
සභාපති
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව

සඳහා එළඹිය යුතු ගිවිසුම් සියල්ල පූර්ණ ලෙස ඉටු කර නොතිබිණි.	බැවින් ගිවිසුම්වලට එළැඹ නැත.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපල සඳහා අය විය යුතු සියලු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබිණි.	ටෙන්ඩර් මත බදු දුන් දේපල නොමැති බැවින් බදු මුදල් අයකරගෙන නැත.
නිහ හිටි බදු කුලී අයකර ගැනීම සම්බන්ධව අදාළ ගිවිසුම් ප්‍රකාර නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබිණි.	නිහ හිටි බදු කුලී නොමැත.
දීර්ඝ කාලීනව බදු දුන් දේපළ වලින් වාර්ෂිකව අයකල යුතු බදු කුලී අයකර ගෙන නොතිබුණු අවස්ථා විය	බදුකුලී අයකරගෙන ඇත.

සභාපති,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.

අමිපර ගාමිණී කළුආරච්චි (විද්‍යාමික)
සභාපති
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව

පාර්ලිමේන්තු ප්‍රශ්නමාලා අංකය - 492 ආයතනයේ නම : අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව දෙවන කොටස : 48.50	
රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	**ගෙන ඇති ක්‍රියාමාර්ග**
සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබිණි	සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර තිබුණි.
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබිණි	2023 වර්ෂයේදී වෙබ් අඩවිය සැකසීමට ක්‍රියාමාර්ග ගෙන තිබුණි.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට පිළිවෙලක් නොතිබිණි.	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කර ඇත.
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස්කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබිණි	වරිපනම් කලාපයක් නොමැති අතර රැස් කරන අපද්‍රව්‍ය සඳහා ගාස්තු අය නොකරයි. ඉදිරියේදී අයකිරීමට බලාපොරොත්තු වෙමි.
ප්ලාස්ටික් හා පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමේ සංවිධානාත්මක වැඩපිළිවෙලක් නොතිබිණි.	ප්ලාස්ටික් හා පොලිතීන් දැනට රජ්ගම මොන්රෝවියාවත්ත කසළ අංගනයට යවන අතර දැනට අප විසින් මිලදී ගෙන ඇති බේල් යන්ත්‍රය මගින් බේල් කර ඒවා වෙළඳුන්ට ලබා දීමට කටයුතු කරයි.
පලාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබිණි.	පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබා දී ඇත.
මහනගර සභා ආඥා පනතේ 272 වගන්තිය/ නගර සභා අඥා පනතේ 157 වගන්තිය/ ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා	ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නැත. ඉදිරියේදී පැනවීමට බලාපොරොත්තු වේ.

මේජර් කාමිණී කරුණාරත්න(ඔහුවිත)
සභාපති
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව

නොතිබිණි.	
අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාව වෙත ප්‍රවේශයක් සලසා දී නොතිබිණි	සභාව මඟින් අතුරු ව්‍යවස්ථා පනවා නැත. සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇත.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් නොතිබිණි	පුරවැසි ප්‍රඥප්තිය ප්‍රදර්ශනය කර ඇත. එසේම එම කටයුතු අධීක්ෂනය කරනු ලබයි.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් සංවර්ධන නිලධාරී පත්වීම් ලබා දීම හේතුවෙන් අනුමත සීමාව ඉක්මවා ගොස් ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු මට්ටමක පැවතුණි	2024/25 වර්ෂවලදී ඉහළ ප්‍රගතියක් ලබාගැනීමට කටයුතු කර ඇත.
පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කර නොතිබිණි	පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කරමින් පවතියි.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කල හැකි කාර්ය සාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබිණි	ඉදිරි වර්ෂය සඳහා හඳුනාගැනීමට කටයුතු කරමි.
නිළධාරීන්ගෙන් රජයට,පළාත් සභාවට හෝ සභාවට සිදු වූ පාඩු පූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබිණි	2023 වර්ෂයට අදාළව හඳුනාගෙන නොමැත.

සභාපති,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.

මේජර් ගාමිණී කරුණාරත්න(විශ්‍රාමික)
සභාපති
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව

පාර්ලිමේන්තු මාලාවේ අංකය - 492

ආයතනයේ නම - ඇල්පිටිය ප්‍රාදේශීය සභාව

.ජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම. ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
<u>පළමු කොටස : 67.00</u>	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	විගණකාධිපති විසින් අප ආයතනය වෙත යොමු කරන ලද අංක SPLG/GL/A/ELPPS/5/23/37 හා 2024.05.30 දිනැති 2023 මුදල් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විගණකාධිපති වාර්තාව අනුව විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.2023 වර්ෂය සඳහා මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳ ඇගයීම් සඳහා සකස් කර ඇති මාර්ගගත කොරතුරු කළමණාකරණ පද්ධතිය වෙත අප විසින් තොරතුරු ලබා දීම අනුව ද, වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇති බව දක්වා ඇත.
ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සිට ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය යාවත්කාලීනව පවත්වා ඇත.
ස්ථාවර චත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සිට ස්ථාවර චත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ඇත.
විදුලි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	සභා බල ප්‍රදේශය තුළ සමස්ථ විදුලි පහන් කණු අංකනය මේ වන තෙක් අවසන් වී නොමැති බැවින් විදුලිපහන් ලේඛනයේ සියලු කණු අංකනයන් ඇතුළත් කිරීමට නොහැකි වී ඇත. අංකනය කර ඇති විදුලි

ඩබ්.එල්. සනත් ප්‍රියන්ත සුමනසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
ඇල්පිටිය

	පහත් කණු අංක විලිපහන් ලේඛනයට ඇතුළත් කර ඇති අතර, 2026 වසරේ සිට කණු අංකනය නැවත ආරම්භ කිරීම සඳහා සභා අනුමැතිය ගෙන ඇති අතර,කණු අංකනය කිරීමේ කටයුතු අවසන් කර විටී පහෙන් ලේඛනයට ඇතුළත් කර ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු කරමි.
මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු කරමි.
ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සිට ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සිට ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
සභාව විසින් වියදම් සීමාවන් තීරණය කර නගරාධිපතිවරයා/සභාපතිවරයා සහ නිලධාරීන් වෙත පැවරීමක් සිදු කර නොතිබුණි.	මහා සභාව විසින් රු.ලක්ෂ 05 ක් දක්වා වියදම් අනුමත කිරීමේ බලය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට 2025 වසරේ සිට පවරා ඇත.
මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම ප්‍රමාණවත් තරම් පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි.	ආයතනය තුළ මුදල් බැංකු ගත කිරීම,ආදායම් ලබා ගැනීම,ගබඩා කටයුතු,වෙක් පත් ලිවීම හා අත්සන් කිරීම,බිල්පත් මගින් මුදල් අයකර ගැනීම ආදී කටයුතු නිලධාරීන් වෙත ලිඛිතව පවරා ඇත.
මාසිකව වැටුප් ලේඛන සහ පාලන ගිණුම් තුලනය කර සහ අදාළ සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.	මාසිකව වැටුප් ලේඛන සහ පාලන ගිණුම් තුලනය කර අදාළ සැසඳුම් ප්‍රකාශ 2024 වසරේ සිට පිළියෙල කිරීම සිදු කරනු ලබයි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. සනත් ප්‍රියන්ත සුමනසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
ඇල්පිටිය

මෘදුකාංගයට අදාළ මූරය තුන්මසකට වරක් වෙනස් කර නොඇත්තුණි.	2026 ජුනි මාසයේ දී අවශ්‍ය උපදෙස් ලබාගෙන පවතින මුර පදය වෙනස් කිරීමට අවශ්‍ය කටයුතු කරමි.
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2026 වසරේදී ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර ඇත.
සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර කර නොතිබුණි.	2026 වර්ෂය සඳහා සකසා ඇති ප්‍රධාන සංයුත සැලැස්මට අනුව 2026 වසරේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකසා සභා සම්මත කරගෙන ඇත.
සංයුත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2026 වර්ෂය සඳහා සකසා ඇති ප්‍රධාන සංයුත සැලැස්මට අනුව 2026 වසරේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකසා ඇත.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයා නොතිබුණි.	2024,2025 වර්ෂයන්හී හා 2026 වර්ෂයන්හී මේ වන තෙක් විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු නියමිත දිනට සපයා ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවධානය වාර්තා විය.	2024 හා 2025 වර්ෂ සඳහා අභ්‍යන්තර විගණන විෂය නිලධාරී විසින් නිකුත් කර ඇති අභ්‍යන්තර විගණන වාර්තා ආයතන ප්‍රධානියා වෙත යොමු කර ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම අදාළ විෂය නිලධාරීන් වෙත යොමු කරන අතර,ඔවුන් විසින් නිර්දේශ සඳහා පිළිතුරු ලබා දීම සිදු කර ඇත.
සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	මේවන විට ඉඩම් 03 ක් පමණ මැනුම් කර මායිම් කණු සිටුවා ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කර ඇත.තවත් ඉඩම කිහිපයක් මැනුම් කිරීම සඳහා මුදල් මිනින්දෝරු කාර්යාලයට ගෙවා ඇත.සභාවට අයත් ඉඩම් පවරා ගැනීම සඳහා ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ඉඩම් ප්‍රතිසංස්කරණ

එල්.එල්. සනත් ප්‍රියන්ත සුමනසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
ඇල්පිටිය

	කොපියක් සභාව වෙත ලිපිකොමු කර ඇත.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට ධාවන සටහන් සම්බන්ධව රියදුරන් දැනුවත් කර දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණනය වෙත යොමු කරනු ලබයි.
වාහනයක් ගර්හිත වී මාස 8 ට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	අපහරණය කිරීම සඳහා දැනට පවතින 32 ශ්‍රී ඩිපෙන්ඩරය අපහරණය කිරීමට කටයුතු කරමින් පවතින අතර, 2026 වර්ෂය අවසන් වීමට ප්‍රථම එම අපහරණ කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කරමි.
වර්ෂයට අදාළව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	2024 වර්ෂයේ බිල් කළ ආදායම රු.343,065,250.00 ක් වන අතර, අය කළ ආදායම රු.105,664,833.04 ක් වන අතර, ප්‍රතිශතය 31% කි. 2025 වර්ෂයේ බිල් කළ ආදායම රු.251,801,000.00 ක් වන අතර, අය කළ ආදායම රු.121,525,201.23 වන අතර, ප්‍රතිශතය 48% ක් වේ.මේ අනුව 2024 වර්ෂයට වඩා 2025 වර්ෂයේ බිල් කළ ආදායමට වඩා අය කළ ආදායම වර්ධනයක් පෙන්නුම් කර ඇත.
දීර්ඝ කාලීනව බදු දුන් ඉඩම්වල සියල්ල සඳහා ගිවිසුම් ගතවී කටයුතු අවසන් කර නොතිබුණි.	මේවන විට දීර්ඝකාලීනව බදු දුන් සියලු කඩකාමර ගිවිසුම් ගතවී කටයුතු අවසන් කර ඇත.
දීර්ඝ කාලීනව බදු දුන් දේපලවලින් වාර්ෂිකව අය කළ යුතු බදු කුලී අය කරලෙහෙන් තොතිබුණු අවස්ථා විය.	දීර්ඝකාලීනව පවතින අයකර ගත නොහැකි රු.2,176,382.00 ක් බදු කුලී ගිණ සහා පනතේ 182 වගන්තිය යටතේ කපා හැරීම සඳහා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති අතර,ඉතිරි ගිණ මුදල් වරින් වර අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.
දළ යුතුකම් කොටස : 33.50	

ඩබ්.එම්. සනත් ප්‍රියන්ත සුමනසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
ඇල්පිටිය

සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.	2024 වසරේ සිට සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර ඇත.
ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛනය 2022 වසරේ සිට සකස් කර පවත්වාගෙන යනු ලබයි.
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	2024 අගෝස්තු මාසයේ සිට වෙබ් අඩවිය නිසියාකාරව ක්‍රියාත්මක කර ඇත.
ආයතනයේ පවත්වාගෙ යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	2024 අගෝස්තු මාසයේ සිට ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇත.
හදුනාගත් තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	දිළිඳුකම දුරලීම,පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව,යහපත් සෞඛ්‍ය හා යහ පැවැත්ම, තිරසර නගර හා ප්‍රජාවන් යන හදුනාගත් තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක ලෙස සභා බල ප්‍රදේශයේ ජීවත්වන දිළිඳු ජනතාවගේ ආර්ථික සම්පත්වලට ප්‍රවේශයක් ලබා දීම, පිරිසිදු ජලය ලබා දීමට අවශ්‍ය පහසුකම් සැලසීම, වස විස නැති ඉහළ පෝෂණයෙන් යුතු දේශීය ආහාර පරිභෝජනයට අවස්ථාව ලබා දීම, පළතුරු උයන් ඇති කිරීම යන ඉලක්ක 2024 වසරේ සිට තීරණය කර තිබුණි.

ඩබ්.එම්. සනත් ප්‍රියන්ත සුමනසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
ඇල්පිටිය

හඳුනාගෙන් සිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	හඳුනාගෙන් සිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක ලෙස 01. පවත්වන ස්වයං රැකියා වැඩසටහන් ගණන 02. පිරිසිදු කළ ජල මූලාශ්‍ර ගණන 03. ගෙවතු වගා ප්‍රතිලාභීන් සංඛ්‍යාව 04. වගා කරන ලද පළතුරු පැළ සංඛ්‍යාව යන ජයග්‍රහණ දර්ශක 2024 වසරේ නියම කර තිබුණි.
ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි.	ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව කසළ කළමනාකරණ සැලැස්මක් 2024,2025 වර්ෂ සඳහා සකස් කර ක්‍රියාත්මක කර ඇති අතර, 2026 වසර සඳහා සකස් කර සභා අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කරගෙන යවයි.
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථානවලින් හා ආයතනවලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථානවලින් හා ආයතනවලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර ගැනීම සම්බන්ධව 2026 වසරේ ඉදිරි මාසයක මහා සභාවට යොමු කර අනුමැතිය ලබාගෙන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර ගැනීමට අපේක්ෂා කරමි.
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	2025 වර්ෂයේ සිට ඇල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කෙරෙමින් පවතින අතර, ඒ අනුව පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනාගෙන පරිසර බලපත්‍ර ලබාදිය යුතු

ඩබ්.එම්. සනත් ප්‍රියන්ත සුමනසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
ඇල්පිටිය

	ආයතන සඳහා පරිසර බලපත්‍ර ලබා දීමට අවශ්‍ය කටයුතු කරමි.
මහ නගර සභා ආඥා පනතේ 157 වගන්තිය /ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා සකසා පනවා නොතිබුණ ද 1988.08.23 දින අංක 520/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 1 සිට 42 දක්වා සම්මත අතුරු ව්‍යවස්ථා 2009.08.18 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමට ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ මහ සභාව විසින් ඒකමතිව සම්මත කරගෙන ඇති අතර, 2013.05.17 දින අංක 1811 දරණ සම්මත අතුරු ව්‍යවස්ථාවල I – XXIX කොටස දක්වා වූ යෝජනා 2024.10.11 දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගෙන ඇත.
ආයතනයේ පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ආයතනයේ පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි පත් කර ක්‍රමවේදයක් සකසා ඇති අතර, අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	2023.11.30 දිනැති අංක රා.ප.ව.02/2018 (I) මඟින් කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවන බව දැනුම් දී ඇති බැවින් සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් නොකරන ලදි.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	2022 වර්ෂයේ සංවර්ධන නිලධාරීන් අතිරික්තව බඳවා ගෙන ඇත.මූ.රෙ.71 මඟින් අනුමත කාර්ය මණ්ඩලයට එම අතිරික්ත සංවර්ධන නිලධාරීන් ඇතුළත්

ඩබ්ලිව්.ඩබ්ලිව්. සනත් ප්‍රියන්ත සුමනසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
ඇල්පිටිය

	කර ගැනීමට අවශ්‍ය කටයුතු සඳහා යොමු කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබුණු පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමේ පැවතුණි.	50% ට වැඩි පිරිසකට වර්ෂයකට පුහුණු අවස්ථා ලබා දේ.2026 වර්ෂයේ සිට මානව සම්පත් සංවර්ධන සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂා කරමි.
විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි සියලු නිර්දේශ ක්‍රියාත්මක කර ඇති අතර අනෙකුත් නිර්දේශ ද ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරමි.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරනය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2023 භාණ්ඩ සමීක්ෂණ වාර්ථාවෙන් අනාවරණය වූ නිර්දේශ 2024 වර්ෂය තුලදී ක්‍රියාත්මක කර තිබුණි.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගනකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විධිමත් පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
වර්ෂයට අදාලව බිල් කල ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	COVID තත්ත්වය සහ ආර්ථික අර්බුදය හමුවේ බදු ගෙවීම අඩු මට්ටමක පැවති අතර වර්ථමානයේ ආදායම් රැස් කිරීමේ ප්‍රවර්ධන වැඩසටහන් (ජංගම සේවා) සඳහා යොමු වී ඇත.
දීර්ඝ කාලීනව බදු දුන් දේපළ සියල්ල සඳහා ගිවිසුම් ගත වී කටයුතු අවසන් කර නොතිබුණි.	එම අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු සිදු කර ඇත.
දීර්ඝ කාලීනව බදු දුන් දේපළවලින් වාර්ෂිකව අයකළ යුතු බදු කුලී අය කරගෙන නොතිබුණු අවස්ථා විය.	වාර්ෂික බදු කුලී නියමිත පරිදි අය කිරීම සිදු කරන ලදී.

සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභාව,
කලේගාන

බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභාව
කලේගාන, ගාල්ල.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇඟයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	**ගෙන ඇති ක්‍රියාමාර්ග**
දෙවැනි කොටස : 47.00	
ජාතික ප්‍රතිපත්ති වලට අනුකූලව කසල කළමණාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි.	කසළ කළමණාකරණ සැලැස්මක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.
කසල අපහරණය කිරීම/ කසල කළමණාකරනය කිරීම සඳහා සභාව විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි.	එක් රැස් කරන ලද කසල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල කළමණාකරණය සඳහා ඉඩ පහසුකම් නොතිබූ බැවින් දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මොන්රෝවියාවත්ත කසල අංගනය සමඟ ගිවිසුම් ගත වී කසළ කළමනාකරනය කිරීමට කටයුතු සිදු කර ඇත.
පළාත් පාලන ආයතනයේ පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.	සුදුසුකම් සපුරා ඇති සියලු ආයතන සඳහා පරිසර බලපත්‍ර ලබා දීමට කටයුතු කර ඇත. බලපත්‍ර නොගත් අනෙකුත් ආයතන සඳහා ද බලපත්‍ර දීම සඳහා අවධානය යොමු කර ඇත.
අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	කාර්යාලය ,මහජන පුස්ථකාලය සහ සභාවේ නිල වෙබ් අඩවිය තුළ ප්‍රදර්ශනය සඳහා අවධානය යොමු කර ඇත.
ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ලේකම් මඟින් අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ඇත.

සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභාව,
කලේගාන

ඒ.එම්. ලලනි ජයමිණි
සභාපති
බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභාව
කලේගාන, ගාල්ල.

2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබූ නමුත් වර්ථමානයේ දී එම සැලැස්ම සකස් කිරීමට අවධානය යොමු කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුනු අවස්ථාවන් ලබා දීමට කටයුතු සිදු කර ඇත.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත් ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට නොහැකි වූ බව පිළිගනිමි.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරයෙකු නම් කර නොතිබුණි.	එම කාර්යන් ඉටු කිරීම සඳහා ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරිව පත් කිරීම සිදු කර ඇත.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබුණි.	වසර 25 ට පෙර ආයතනයේ කාර්ය මණ්ඩලය අනුමත කිරීම සිදු කර ඇති අතර බල ප්‍රදේශය ජනාකීර්ණ වීමත් සමඟ සේවා අවශ්‍යතාවය මත අමතර කාර්ය මණ්ඩල සේවක පිරිසක් බඳවා ගැනීමට සිදුව ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	සැලසුම් ගත අයුරින් සේවක අවශ්‍යතාව මත පුහුණු වීම් සඳහා යොමු කර ඇත.

සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභාව,
කලේගාන

ඒ.එල්. ලලනි ජයමිණි
සභාපති
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
කලේගාන, ගාල්ල.

විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කොට ඇත.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක මේ වන විට හඳුනා ගෙන ඇත.

සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව,
කලේගාන

ඒ.එල්. ලලනි ජයමිණි
සභාපති
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
කලේගාන, ගාල්ල.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක-492

ආයතනයේ නම- යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය වන්නේ තත්ත්වාගණනය කල මතයක් බව කාරුණිකව දන්වමි.
ඉඩම් හා ගොඩනැගිලි ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ඉඩම් ගොඩනැගිලි ලේඛණය මේ වන විට යාවත්කාලීන කර ඇති බව කාරුණිකව දන්වමි.
ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛණය මේ වන විට ආකෘතිය 22 යටතේ යාවත්කාලීන කර ඇති බව කාරුණිකව දන්වමි.
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2026-2030 දක්වා කාල සීමාවට අදාළව ප්‍රධාන සංයුත සැලැස්ම සකස් කර ඇති බව කාරුණිකව දන්වමි.
සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා 2026.04.07 දිනැති මුදල් කමිටුව මඟින් කමිටුවක් පත් කර ඇති අතර ඉඩම් වල වැට මායිම් සකස් කිරීමට මායිම් නිරවුල් කර ගැනීම සඳහා බලයලත් මිනින්දෝරුවරයෙකු වෙත යොමු කර ඇති බව කාරුණිකව දන්වමි.
වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	252-6472 කැබ් රථය හා 53-5699 කැබ් රථය ලියාපදිංචි සහතිකය අවලංගු කර ගා/මහින්ද විද්‍යාලයේ අධ්‍යාපන කටයුතු සඳහා පරිත්‍යාග කරන ලදී.49-1996 මිණි ට්‍රැක්ටරයේ ලිපි ලේඛණ අඩුපාඩු හේතුවෙන් අපහරණය කිරීම ප්‍රමාද වී ඇත.අදාල ලේඛණ සකස් කර අවසන් කර ඇති අතර ලියාපදිංචිය අවලංගු කිරීමේ කටයුතු සිදු කර අපහරණ කටයුතු සිදු කිරීමට නියමිත බව කාරුණිකව දන්වමි.
ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දිය යුතු සභාවේ දේපළ සමාලෝචිත වර්ෂය තුලදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබුණි.	සභාව සතු වාර්ෂික ටෙන්ඩර් දිය හැකි දේපල වනුයේ නාන තටාකය,සතිපොළ,රථගාල හා මාළු කුටිය වේ.සියලු දේපල බදු දීම සඳහා ටෙන්ඩර් කලද මාළු කුටිය හා රථ ගාල සඳහා කිසිදු බදුකරුවෙක් ඉදිරිපත් වුයේ නැත.සතිපොළ 2024,2025,2026 වර්ෂ වල ටෙන්ඩර්කරුවෙකු මඟින් බදු කුලි අය කර ගැනීම සිදු කරන අතර අනෙකුත් දේපල සභාව මඟින් පරිපාලන කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වමි.
වාර්ෂිකව ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා අය විය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අය කර නොතිබුණි.	සභාව මඟින් ටෙන්ඩර් ලබා දී ඇති සතිපොළ මඟින් නියමිත පරිදි බදු කුලි අය කිරීම සිදු කරන අතර හිඟව පවතින මාළු කුටියේ බදු කුලිය සඳහා නඩු පැවරීමක් සිදු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.
ව්‍යාපාර බදු හා වෙළෙඳ බලපත්‍ර බදු අය කර ගැනීම සඳහා සමීක්ෂණ පැවැත්වීමක් කර නොතිබුණි.	2023 වර්ෂයේ ආදායම් පරීක්ෂක නිලධාරියෙකු නොසිටි බැවින් සමීක්ෂණයක් සිදු කර නොමැති අතර 2024,2025,2026 වර්ෂ සඳහා බල ප්‍රදේශයේ ව්‍යාපාර,කර්මාන්ත හා වෙළෙඳ බලපත්‍ර ලබා ගත යුතු ස්ථාන සමීක්ෂණයක් මඟින් හඳුනා ගෙන උපලේඛණ පිළියෙල කර ඇති බව කාරුණිකව දන්වමි.

සභාපති
ප්‍රාදේශීය සභාව
යක්කලමුල්ල

ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවැරීමක් සිදු කර නොතිබුණි.	බලපත්‍ර ලබා ගැනීමට සුදුසුකම් සපුරා ඇති සියළුම ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබා දීම සිදු කර ඇති බව කාරුණිකව දන්වමි.
දෙවැනි කොටස	
සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.	සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර ඇති බව කාරුණිකව දන්වමි.
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වා ගෙන ගොස් නොතිබුණි.	Yakkalamulla.ps.gov.lk ලෙස වෙබ් අඩවිය නිර්මාණය කර ඇති අතර එය යාවත්කාලීන කර ඇති බවද කාරුණිකව දන්වමි.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	E-sabha app එක හරහා මහජනතාවට පැමිණිලි යොමු කිරීමට අවස්ථාව සලසා දී ඇත.තවද facebook page එක හරහා ද මහජනතාවට පැමිණිලි ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වමි.
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සඳහා වන සැලැස්ම 2030 දක්වා සකස් කර ඇත.ඒ අනුව අරමුණු හඳුනා ගෙන ඇති බව කාරුණිකව දන්වමි.
හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	ඒ ඒ අරමුණු සඳහා ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන වැඩසටහන් ක්‍රියාත්මක කරන බව කාරුණිකව දන්වමි.
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ඡයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	ඡයග්‍රහණ දර්ශක හඳුනාගෙන ඇති බව කාරුණිකව දන්වමි.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙළක් නොතිබුණි.	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය රැස් කිරීම, ක්‍රියාකාරී පස් අවුරුදු සැලැස්මට ඇතුලත් කර ඇති අතර වර්තමානයේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම එක් රැස් කිරීමට වැඩසටහන් පවත්වා ගෙන යන බව කාරුණිකව දන්වමි
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබා ගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.	පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම සඳහා ආයතන වෙත ලිඛිතව දැනුවත් කිරීම් සිදු කර ඇත.ඒ අනුව සුදුසුකම් සම්පූර්ණ කරන ආයතන සඳහා බලපත්‍ර නිකුත් කර ඇති බව කාරුණිකව දන්වමි.
2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කල යුතු කාර්යභාර්ය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කල හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	මේ වන විට කාර්යයසාධන දර්ශක(KPI) සකස් කරමින් පවතින බව කාරුණිකව දන්වමි.

සභාපති
ප්‍රාදේශීය සභාව
යක්කලමුල්ල

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - රජ්ගම ප්‍රාදේශීය සභාව.

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්ය සාධන ඇගයීම ප්‍රකාරවහදුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස - 65.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ තත්වාගණනය කළ මතයක් ලබා දී ඇත.
විගණන විමසුම් ලේඛනය/අභ්‍යන්තර විගණන විමසුම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර පවත්වාගෙන යයි.
ලැබෙන වෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලබයි.
වීඊ පහන් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලබයි.
මිණුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ඉදිරියේදී මිනුම් පොත් පවත්වාගෙන යාමට කටයුතු කරමි.
මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	වසම් මට්ටමින් මාර්ග මැනීමේ කටයුතු අවසන් කර ඇති අතර ඉදිරියේදී මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීමට කටයුතු කරමි.
නඩු ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	වර්ථමානයේදී නඩු ලේඛණය නිසි පරිදි නඩත්තු කරනු ලබයි.
ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	පවත්වාගෙන යනු ලබයි.
ගල් හා බොරලු ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ගල් හා බොරලු ලේඛණය පොත් පවත්වාගෙන යාමට කටයුතු කරමි.
සභාව විසින් වියදම් සීමාවන් තීරණය කර නගරාධිපතිවරයා/සභාපතිවරයා සහ නිලධාරීන් වෙත පැවරීමක් සිදු කර නොතිබුණි.	වර්ථමානයේ වියදම් සීමාවන් පැවරීම සිදු කර ඇත.
මුදල් රෙගුලාසි පරිදි ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි.	මූල්‍ය බලතල පැවරීම් ලේඛණයක් සකස් කර ඇත.

පී.ඩබ්. දුලාජී තරංගි
සභාපති
රජ්ගම ප්‍රාදේශීය සභාව
රජ්ගම.

මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර නොතිබුණි.	මේ සම්බන්ධව ආයතනය තුළ සන්නිවේදනය කිරීමට කටයුතු කරමි.
මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙණුවක්ම ප්‍රමාණවත් තරම් පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි.	මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව දන්වා සිටිමි.
මාසිකව වැටුප් ලේඛණ සහ පාලන ගිණුම් තුලනය කර සහ අදාළ සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර නොතිබුණි.	වැටුප් ලේඛණ හා පාලන ගිණුම් තුලනය කර අදාළ සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කරමි.
මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	මුරපද තුන්මසකට වරක් වෙනස් කිරීමට කටයුතු කරමි.
ප්‍රධාන සංයුත සැළැස්ම පිළියෙල කර නොතිබුණි.	සංයුත සැළැස්ම පිළියෙල කිරීමට කටයුතු කරමි.
සංයුක්ත සැළැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර සභා සම්මත කර නොතිබුණි.	2026 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී පිළියෙළ කර සභා සම්මත කර ඇත.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.	2026 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම පිලියෙල කිරීමට කටයුතු කරමි.
සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනට අනුමත කර ගෙන නොතිබුණි.	නියමිත දිනට සැළසුම් අනුමත කර ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිලිතුරු සැපයීම සිදු කරයි.
මු.රෙ.ප්‍රකාරව අභ්‍යන්තර විගණන විමසුම් වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන විමසුම් වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරයි.
විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිලියෙල කර නොතිබුණි.	වර්ෂය ආරම්භයේදී අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙළ කරනු ලබයි.
සියළු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	වත්කම් වල ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කරමින් පවතී.
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	වාහන වල අයිතිය පවරා ගැනීමෙන් අනතුරුව ගර්හිත වාහන අපහරණයට කටයුතු කරමි.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	මෙම කාලසීමාවේදී සිදු වූ අනතුරු සම්බන්ධයෙන්ද මු.රෙ පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැළපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	නිරවුල් කර ඇත.

පී.එච්. දුලාජ් තරංග
සභාපති
රජ්ගම ප්‍රාදේශීය සභාව
රජ්ගම

හිඟ හිටි බදු කුලී අය කර ගැනීම සම්බන්ධව අදාළ ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	හිඟ බදු හිමියන් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී.
ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදු කර නොතිබුණි.	2026 වර්ෂයේ සිට නඩු පැවරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව,
රජ්ගම.

පී.එච්. දුලාජ් තරංග
සභාපති
රජ්ගම ප්‍රාදේශීය සභාව
රජ්ගම.

ආයතනයේ නම - රජ්ගම ප්‍රාදේශීය සභාව.

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්ය සාධන ඇගයීම ප්‍රකාරවහදුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
දෙවන කොටස - 65.00	
මහජනයා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා දීම/ලබා නොදීම සම්බන්ධව විස්තර ඇතුළත් ලේඛණයක් පවත්වා නොතිබුණි.	ලේඛණයක් පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත.
හදුනාගත් තිරසර අරමුණු ඉටුකර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	ඉලක්ක තීරණය කර ඇත.
හදුනා ගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	තිරසර අරමුණු හදුනාගෙන ඇති අතර ඉදිරියේදී අදාළ වැඩසටහන් සඳහා තිරසර අරමුණු හි ජයග්‍රහණ දර්ශක නියම කරමින් වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන බව දන්වමි.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි.	2026 වර්ෂයේ වැඩපිළිවෙලක් සකසා ඇත.
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	අතුරු ව්‍යවස්ථා පැනවීමක් සිදු කර ඇත.
අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.	2026 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර සභා අනුමැතිය ලබා ඇත.
අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	2026 වර්ෂයේ මහජනයාට අතුරු ව්‍යවස්ථා පරිශීලනයට අවස්ථාව ලබා දී ඇත.
2018 ජනවාරි24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2026 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් පිළියෙල කොට ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2026 වර්ෂය සඳහා පිළියෙල කරන ලද මානව සම්පත් සැලැස්ම තුළින් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවන් සහතික කර ඇත.

පී.ඒච්. දුලාජ් තරංග
සභාපති
රජ්ගම ප්‍රාදේශීය සභාව
රජ්ගම.

සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	රාජ්‍ය පරිපාලන ,ස්වදේශ කටයුතු ,පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය විසින් 2023.11.30 නිකුත් කර ඇති ලිපිය මඟින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/2018 හි (I)ඡේදය මින් සංශෝධනය කරනු ලබන අතර ඒ අනුව එම චක්‍රලේඛයේ සඳහන් පරිදි "වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තව දුරටත් අවශ්‍ය නොවේ." ලෙස සඳහන් කර ඇත. අතිරික්ත සියළුම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත මු.රෙ.71 මඟින් යොමු කොට ඇති අතර 2025 කාර්යය මණ්ඩල සමාලෝචන වාර්තාවටද මෙම අතිරික්ත තනතුරු සියල්ල අනුමත කරන ලෙස ඉල්ලීම් කර ඇත.
අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩල බඳවාගෙන තිබුණි.	
සැළසුම් ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පුහුණු අවශ්‍යතා පරිසාධන මට්ටම වෙත ලඟා කර ගැනීමට කටයුතු කරන බව දන්වමි.
2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කල යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කල හැකි කාර්යසාධක දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි.
වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකල අදාළ නිළධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	සියළුම නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇති බව දන්වමි.

පී.එච්. දුලාජ් තරංගේ
සභාපති
රජ්ගම ප්‍රාදේශීය සභාව
රජ්ගම.

සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව,
රජ්ගම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය -492

ආයතනයේ නම - වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම් කාරක සභාව විසින් කාර්ය සාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියා මාර්ග
පලමු කොටස 86.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් තත්ත්වාගණනය කරන ලද මතයක් ප්‍රකාශ කර ඇත.
මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කරනු ලැබේ
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර නොතිබුණි	2023-2026 වර්ෂ දක්වා ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර ඇත.
සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර නොතිබුණි.	සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට 2022.12.30 සභාව මගින් සම්මත කර ඇත .
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. මු.රෙ ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සෑම කාර්තුවකටම වරක් පැවැත්වෙන විගණන කළමනාකරණ කමිටුවේදී මාසික අභ්‍යන්තර විගණන වාර්තාවල ඇතුළත් සියලු කරුණු සාකච්ඡා කර එහි ප්‍රගතිය පිළිබඳ විමසිම් සිදු කරන බව කාරුණිකව දන්වමි. මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් මේ වන විට විගණකාධිපති වෙත යොමු කරන බව කාරුණිකව දන්වමි.
සියලු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	ප්‍රාදේශීය සභාවට අයත් හා ප්‍රාදේශීය සභාව භුක්ති විඳිනු ලබන ඉඩම් අතුරින් කොටසක මේ වන විටත් ආරක්ෂිත වැටවල් යොදා ආරක්ෂාව තහවුරු කර ඇති අතර , ප්‍රාදේශීය සභාවේ පවතින මූල්‍ය තත්ත්වය මත ඉදිරියේ දී සෙසු ඉඩම් වලද ආරක්ෂිත වැටවල් යොදා ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කරනු ලැබේ.
ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දිය යුතු සභාවේ දේපළ සමාලෝචිත වර්ෂය තුළදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබුණි.දීර්ඝ කාලීනව බදු දුන් දේපළවලින් වාර්ෂිකව අයකළ යුතු බදු කුලී අයකර ගෙන නොතිබුණු අවස්ථා විය.	ඉඩම් සම්පූර්ණ ලෙස බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවූ නමුත් සියළු ඉඩම් ටෙන්ඩර් මගින් ලබා ගැනීමට ඉදිරිපත් වී නොමැත. බදු දෙන ලද සියළු ඉඩම් වලින් හිඟයකින් තොරව බදු මුදල් අයකර ගෙන ඇති බව කාරුණිකව දන්වමි.

පී. එම්. වසන්ත
සභාපති
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව
අගලිය - බද්දේගම

රජයේ ගිණුම් කාරක සභාව විසින් කාර්ය සාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියා මාර්ග
දෙවන කොටස :52.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා මේ වන විට වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන යනු ලබයි. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා මේ වන විට අවස්ථාව සලසා දී ඇත.
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි. හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු මේ වන විට හඳුනාගෙන ඇති අතර, හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර ඇත. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක ද නියම කර ඇත.
ජාතික ප්‍රතිපත්ති වලට අනුකූලව කසල කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි.	මේ වන විට කසල කළමනාකරණ සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී. සෑම සතියකම සිකුරාදා දින ඇත්කඳුර හා අම්පේගම ප්‍රදේශයේ දිරන කසල එක්රැස් කරනු ලබයි.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි.	2024 වර්ෂයේ පරිසර දිනයට සමගාමීව මධ්‍යම පරිසර අධිකාරිය සමග එක්ව ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ප්‍රදේශයේ මහජනතාව දැනුවත් කර එක්රැස් කර ගන්නා ලද ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය මධ්‍යම පරිසර අධිකාරිය වෙත භාර දෙනු ලැබේ .
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි.	වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වරිපනම් බදු අය කිරීමක් සිදු නොවන අතර, වරිපනම් බදු අය කිරීමට අදාළ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. බලප්‍රදේශයේ ඇතැම් මාර්ග දෙපස ඇති දේපල වලින් සතියකට වරක් දිරන කසල පමණක් එකතු කරනු ලබයි. ඒවා උපයෝගී කරගනිමින් කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය සිදු කරන බව කාරුණිකව දන්වමි.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	2023 වරෂය සඳහා සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. 2023.11.30 දිනැති අංක 2/2018(1) දරණ රා.පරි.වක්‍රලේඛය මඟින් කාර්ය සාධක ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවන බව දන්වා ඇති බව කාරුණිකව දන්වමි.

ජී. එම්. වසන්ත
සභාපති
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව
අයලිය - බද්දෙගම

2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	2020.08.26 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි 12 :1 ඡේදයේ සඳහන්ව ඇත්තේ සියළුම ගණන්දීමේ නිලධාරීන් විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීම සඳහා නියමිත විධිවිධාන යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවයි. ඒ අනුව ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.

පී. එම්. වසන්ත
සභාපති
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව
අහල්ය - බද්දේගම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - හබරාදුව ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා.	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස 64.00	
ආයතනයේ ගිණුම් පිළිබඳව විගණන මතය , යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	2024 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය නත්වාගණනය කල මතයකි. මේ වන විට මූල්‍ය ප්‍රකාශන වල ශේෂ නිරවුල් කිරීම සඳහා කමිටු පත්කර ඇති අතර එම ශේෂ නිරවුල් කර මූල්‍ය ප්‍රකාශන සැකසීමට කටයුතු කරමි.
ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය 2023 වර්ෂයේ සිට යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනය 2023 වර්ෂයේ සිට යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
වීථි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	වීථි පහන් ලේඛනය 2024 වර්ෂයේ සිට යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
මාර්ගය ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සිට මාර්ගය ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කර ඇත.
ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	ඇස්තමේන්තු ලෙජරය 2024 වර්ෂයේ සිට නිසි පරිදි වාර්ෂිකව යාවත්කාලීන කරනු ලැබේ.
ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	ගල් හා බොරලු ලේඛනයක් සභාව සතුව පවත්වාගෙන යනු ලැබුවද, ගල් හා බොරළු යොදා සිදු කරනු ලබන කර්මාන්ත සභාව විසින් ක්‍රියාත්මක නොකරන බව කාරුණිකව දන්වා සිටිමි.
සභාව විසින් වියදම් සීමාවන් තීරණය කර නගරාධිපතිවරයා /සභාපතිවරයා සහ නිලධාරීන් වෙත පැවරීමක් සිදුකර නොතිබුණි.	විගණන විමසුම මහින් පෙන්වා දී නිබූ අඩුපාඩු නිවරදි කරමින් ඉන් පසු 2023 වර්ෂයට මූල්‍ය බලතල පැවරීම් සිදු කර ඇත.
මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර නොතිබුණි.	මූල්‍ය බලතල පැවරීමේ පිටපතක් නිලධාරීන්ට ලබා දී ඇත.
මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගනුදෙනුවක්ම ප්‍රමාණවත් තරම් පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි.	සෑම ගනුදෙනුවක්ම ප්‍රමාණවත් තරම් පරීක්ෂාවට ලක්වන පරිදි මූල්‍ය බලතල පවරා ඇත.
මාසිකව වැටුප් ලේඛන සහ පාලන ගිණුම් තුලනය කර සහ අදාල සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර නොතිබුණි.	2023 වර්ෂයේ සිට මාසික වැටුප් ලේඛන සහ පාලන ගිණුම් මාසිකව යාවත්කාලීන කරනු ලබන අතර , 2024 වර්ෂයේ සිට සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර පවත්වාගෙන යනු ලැබේ.
මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	2023 වර්ෂය අවසානයේ සිට මෘදුකාංගයට අදාල මුරපද තුන්මසකට වරක් වෙනස්කර පවත්වාගෙන යනු ලබයි.
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට 2027 වර්ෂය දක්වා ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	2024 වර්ෂයේ සිට සිදු කරනු ලබන අභ්‍යන්තර විගණන විමසුම් සඳහා නිලධාරීන් පිළිතුරු යොමු කර ඇත.
මු.රෙ.ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	2024 වර්ෂයේ සිට සියලු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යොමු කර ඇත.
සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි	සියළු වත්කම් සඳහා ඉඩම් මැන මායිම් වැටවල් දමමින් සියළුම වත්කම් වල ආරක්ෂාව තහවුරු කරමින් පවතී.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත , ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශයද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	අතිරික්ත ඌණතා ගලපමින් තොග වවිටෝරු පොත් යාවත්කාලීන කර ඇත.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත්	සභාව සතු වාහන සියල්ලේම ධාවන සටහන් හා සාරාංශ නියමිත දිනට විගණකාධිපති වෙත යොමු කර ඇත.(අවසන්

හක්මණ රවිශාන් ගමගේ
සභාපති
හබරාදුව ප්‍රාදේශීය සභාව

කර නොතිබුණි.	වරට ඉදිරිපත් කරන ලද 2026.05.15 දිනැති වේ)
වාහනයක් ගර්හිත වී මාස 8කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි	සභාව සතුව පැවති අපහරණයට නියමිතව තිබූ වාහන අතරින් වාහන 04 ක් 2026.03.13 දින වෙන්දේසි කරන ලද අතර තවත් වාහන 10 ක ලියාපදිංචිය අවලංගු කිරීමට මෝටර් රථ දෙපාර්තමේන්තුවට භාර දෙන ලදි. ඒවායේ ලියාපදිංචිය අවලංගු වූ පසු කඩිනමින් වෙන්දේසි කිරීමට නියමිතය.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර වගකිව යුතු පාර්ශව හඳුනාගෙන ඉදිරි කටයුතු කිරීමට නියමිතය.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි	බැංකු සැසඳුම් ප්‍රකාශවල තිබූ 2023 වර්ෂයට අදාළව ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ නිරවුල් කර ඇත.
වර්ෂයට අදාලව බිල්කළ ආදායමෙන් අයකිරීම පහළ මට්ටමක විය.	2023 වර්ෂයේ බිල්කල ආදායමෙන් මේ වන විට 90% ඉක්මවා අයකරගෙන ඇති අතර, 2026.05.31 දක්වා ද බිල්කල ආදායමෙන් 71% ක් අය කරගෙන ඇත.
ටෙන්ඩර් මත වාර්ෂිකව බදුදිය යුතු සභාවේ දේපළ සමාලෝචින වර්ෂය තුලදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබුණි.	සමාලෝචිත වර්ෂය තුලදී සභාව සතු දේපල ටෙන්ඩර් කලද , කිසිදු පුද්ගලයෙකු ටෙන්ඩර් අයදුම්පත් යොමුකර නැත. මේ වන විට දේපල ටෙන්ඩර් කර බදු දී ඇත.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් දේපල සඳහා එළඹිය යුතු ගිවිසුම් සියල්ල පූර්ණ ලෙස ඉටුකර නොතිබුණි.	බදු දී ඇති දේපල සඳහා ගිවිසුම් ගත වී ඇත.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපල සඳහා අයවිය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අය කර නොතිබුණි.	බදු දී ඇති දේපල සඳහා බදු මුදල් අය කරනු ලැබේ.
හිඟ ගිටි බදුකුලි අයකර ගැනීම සම්බන්ධව අදාළ ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	අදාල කඩගිමියන් වෙත රතු නිවේදන නිකුත් කර ඇති අතර මේ වන විට බිල්කල ආදායමෙන් 90% ඉක්මවා අයකරගෙන ඇත.
දීර්ඝ කාලීනව බදු දුන් දේපළ සියල්ල සඳහා ගිවිසුම් ගත වී කටයුතු අවසන් කර නොතිබුණි.	දීර්ඝ කාලීනව බදුදුන් දේපල බොහොමයක් දැනට ගිවිසුම් ගතව පවතින අතර අනෙකුත් දේපල සඳහා ගිවිසුම් ගත වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

තක්ෂිලා රවිශාන් ගමගේ
සභාපති
හබරාදුව ප්‍රාදේශීය සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - හබරාදුව ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා.	ගෙන ඇති ක්‍රියාමාර්ග
දෙවැනි කොටස 32.50	
සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.	සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර ඇත.
මහජනයා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා දීම/ලබා නොදීම සම්බන්ධ විස්තර ඇතුලත් ලේඛනයක් පවත්වා නොතිබුණි.	මහජනයා විසින් ඉල්ලුම් කරනු ලබන තොරතුරු ලබා දීමට අදාලව ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි.
ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ග පැහැදිලි කරන ලේඛනයක් ඉදිරියේ දී පවත්වාගෙන යාමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි	ආයතනයේ විෂය පථය අනුව 2024 වර්ෂයේ සිට තිරසාර සංවර්ධන අරමුණු 03 ත් හඳුනාගෙන ඇත.
හඳුනාගත් තිරසර අරමුණු ඉටුකර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	එමඅරමුණු ඉටුකර ගැනීම සඳහා ලඟාකරගත යුතු ඉලක්ක තීරණය කර ඇත.
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	එම අරමුණු ඉටුකර ගැනීම සඳහා කල යුතු කාර්ය හා එහි ප්‍රගතිය මැන බලන දර්ශන නියම කර ඇත.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙළක් නොතිබුණි.	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා බහාලුමක් දැනට හබරාදුව ප්‍රාදේශීය සභාවේ තබා ඇති අතර එහි එකතු වන අපද්‍රව්‍ය හා මධ්‍යම පරිසර අධිකාරිය හා ධීවර අමාත්‍යාංශය සමග එක්ව වාර්ෂිකව සිදු කරනු ලබන වැඩසටහන ඔස්සේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය රැස් කිරීම හා අපහරණය සිදු කරනු ලබයි
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය /නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා ගෙනි තිබුණි. එය මේ වන විටත් ක්‍රියාත්මක වේ.
පලාත් පාලන ආයතනය විසින් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොමැත්තේ නම් සම්මත අතුරු ව්‍යවස්ථා සභාව විසින් සභා සම්මතයක් මඟින් පිළිගෙන, ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර එය වැළඳගෙන නොතිබුණි.	එම අතුරු ව්‍යවස්ථා 2023 වර්ෂයේ ගැසට් පත්‍රයේ සම්මත අතුරු ව්‍යවස්ථා පනවා ගෙන ඇත. එය සෑම වර්ෂයකම ගැසට් පත්‍රෙය් ප්‍රකාශයට පත් කරනු ලැබේ.
අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි	අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොමැති බව පිළිගනිමි. ඉදිරියේ දී එය නිවරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	කාර්යාලයට අදාල පුස්තකාලයේ මහජනතාවට පරිශීලනය කිරීම සඳහා තබා ඇත.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	සේවාලාභීන්ගේ සේවා තෘප්තිය ඇගයීමට සහ අධික්ෂණය සඳහා ක්‍රියා පිළිවෙළක් ලෙස , පැමිණිලි පෙට්ටියක් සහ ආකෘතිපත්‍රයක් මඟින් තොරතුරු ලබා ගෙන ඒ අනුව අඩුපාඩු නිවරදි කිරීමට හා අධීක්ෂණයට ක්‍රියා කිරීම.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව ඇත.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන නිබුණි.	2022 වර්ෂයේ සංවර්ධන නිලධාරීන් හට ලබා දුන් පත්වීම් අනුව මෙම නිලධාරීන් අතිරික්ත වූ අතර, මේ වන විට නිදෙනෙකු ගුරු පත්වීම් සඳහා ගොස් ඇත. 08 දෙනෙකු

හක්ෂිණා රවීහාන් හමිගේ
සභාපති
හබරාදුව ප්‍රාදේශීය සභාව

	අතිරික්තව ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2023 වර්ෂයේ සැලසුම්ගත පුහුණු අවස්ථාවලින්50% ප්‍රමාණයක් පමණ පුහුණු පාඨමාලා සඳහා සහභාගී වී ඇත. 2024 වර්ෂයේ පුහුණු පාඨමාලා 82 ක් සැලසුම්ගත කර තිබූ අතර පුහුණු පාඨමාලා 65 ක් සඳහා පමණක් නිලධාරීන් සම්බන්ධ වී ඇත. එය ප්‍රතිශතයක් ලෙස 79% වශයෙන් දැක්විය හැකිය.
විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණන වාර්තාවේ නිර්දේශ බොහොමයක් මේ වනවිට ක්‍රියාත්මක කර ඇත.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රෙල්ඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි	02/2020 දරණ දරන රාජ්‍ය මුදල් චක්‍රෙල්ඛයේ 12.1 ඡේදය ප්‍රකාරව කාර්යසාධක දර්ශක හඳුනා ගැනීමට කටයුතු කර ඇත.
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේ වත්කම් බැරකම් ලබා දීමට නියමිතව තිබුණේ සභා ලේකම් හා ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් දෙදෙනා පමණකි. ඔවුන් තිදෙනාම 2023 වර්ෂයට අදාල වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර තිබුණි. 2024 වර්ෂයේ වත්කම් බැරකම් ප්‍රකාශ සියළුම නිලධාරීන් විසින් ඉදිරිපත් කර ඇත.
වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාල නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානිය විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	මේ වන විට අදාල දිනයට ම (අදාල වර්ෂයේ 06.30 දිනට පෙර) වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දැනුම් දෙමි.

හංසිණ රවීශාන් ගමගේ
සභාපති
හබරාදුව ප්‍රාදේශිය සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - නියාගම ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම් කාරක සභාව විසින් කාර්ය සාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස 74.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය අගිතකර මට්ටමේ තිබීම	ගිණුම්කරණ අඩුපාඩු මගහරවා ගනිමින් අවසන් ගිණුම් සකස් කිරීම
සේවක ණය ලේඛනය නිසි පරිදි යාවත්කාලීන වී නොතිබීම	මේ වන විට යාවත්කාලීන කර ඇත
නඩු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම	2025 සිට නඩු ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි
ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම	2025 වර්ෂයේ සිට යාවත්කාලීන කර ඇත
ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම	ලේඛනය නඩත්තු කිරීමට කටයුතු යොදා ඇත
ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම	2025 වර්ෂයේ සිට යාවත්කාලීන කර ඇත
මාසික වැටුප් ලේඛන හා පාලන ගිණුම් තුලනය කර හා අදාළ සැසඳුම් ප්‍රකාශ පිලියෙල කර නොතිබුනි	2025 වර්ෂයේ සිට පිලියෙල කරමින් පවතී
මෘදුකාංගයට අදාළ මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබීම	2025 වර්ෂයේ සිට යාවත්කාලීන කර ඇත
ප්‍රධාන සංයුත සැලැස්ම පිලියෙල කර නොතිබීම	2022-2025 දක්වා සංවෘත සැලැස්ම සකස් කර ඇත
සංයුක්ත සලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කොට සභා සම්මත කර නොතිබීම	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2025 වර්ෂයේ සිට සභා සම්මත කර ඇත
සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනයට අනුමත කර ගෙන නොතිබීම	2025 වර්ෂයේ සිට නියමිත දිනට අනුමත කර ඇත
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා වීම	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නැත
සියලු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබීම	වත්කම් වල ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී
වාහනයක් ගර්හිත වී මාස 08 ට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම	සභාව සතු කිසිදු වාහනයක් මේ වන විට ගර්හිත මට්ටමේ නොපවතී
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබීම	වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් මේ වන විට විමර්ශනය කරමින් පවතී
ජංගම ගිණුමේ අතිරික්ත මුදල් කාලීන තැන්පතු වල සුදුසු පරිදි ආයෝජනය කිරීම සඳහා වැඩ පිලිවෙලක් සකස් කර නොතිබීම	දැනට ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර ඇත
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපල සඳහා අයවිය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබීම	හිඟ බදු මුදල් අය කිරීමට කටයුතු කරමින් පවතී
හිඟගිටි බදු කුලී අයකර ගැනීම සම්බන්ධව අදාළ ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබීම	ඉදිරියේදී නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබයි
ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදු කර නොතිබීම	2024 වර්ෂයේ සිට නඩු පැවරීම සිදු කර ඇත

එම්. එල්. සිඳත් කුමාර
සභාපති
නියාගම ප්‍රාදේශීය සභාව
නියාගම, හල්ගස්වල

ආයතනයේ නම - - **නියාගම ප්‍රාදේශීය සභාව**

රජයේ ගිණුම් කාරක සභාව විසින් කාර්ය සාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	**ගෙන ඇති ක්‍රියාමාර්ග**
දෙවන කොටස 36.5	
සභාවට අදාල ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබීම	ඩිජිටල් තිරයක් මගින් ප්‍රදර්ශනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබීම	වර්ෂයකට වරක් මධ්‍යම පරිසර අධිකාරිය මගින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කරන අතර ඒ සඳහා දායකත්වය ලබා දීම්
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුනි	2026 වර්ෂයේ සිට ගාස්තු අය කරනු ලබයි
ප්ලාස්ටික් හා පොලිතින් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමේ සංවිධානාත්මක වැඩපිලිවෙලක් නොතිබුනි	ප්ලාස්ටික්,පොලිතින් ප්‍රතිචක්‍රීකරණය සිදු කරන ආයතන වෙත ලබා දීමට කටයුතු කිරීම
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබා ගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුනි	2026 වර්ෂයෙදී නියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින පරිසර බලපත්‍ර නොගත් කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදයක් සකසා ඇත
මහ නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබීම	2025 වර්ෂයේ සිට අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර ඇත
අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුනි	2026 වර්ෂයේ සිට ඒ සඳහා කටයුතු කරනු ලබයි
2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිලියෙල කර ප්‍රදර්ශනය කර නොතිබීම	ඩිජිටල් තිරයක් මගින් ප්‍රදර්ශනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබීම	මෙම වර්ෂයේ මේ සඳහා අවශ්‍ය වැඩපිලිවෙලක් සකස් කරමින් පවතී
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිලියෙල කර නොතිබීම	මානව සම්පත් සැලැස්මක් පිලියෙල කර තිබුනි
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් 50% කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුනු අවස්ථාවක් සහතික කර නොතිබීම	ඉදිරි මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුල සෑම අයෙකුටම පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කරනු ලබයි
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබීම	කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම චක්‍රලේඛයක් මගින් අවලංගු කර ඇත
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබීම	වර්තමානය වන විට සභාව මගින් අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන නැත
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී නිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතීම	ආයතනගත පුහුණු වැඩසටහන් වැඩි ප්‍රමාණයක් සිදු කිරීමට සැලසුම් කරනු ලබයි

එම්. එල්. සිදත් කුමාර
සභාපති
නියාගම ප්‍රාදේශිය සභාව
නියා[illegible]

විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොනිබීම	විගණන වාර්තාවේ නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03 ක් හඳුනාගෙන නොනිබීම	2026 වර්ෂය සඳහා මිනුම් කල හැකි කාර්යසාධක දර්ශක හඳුනාගෙන අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ

එම්. එල්. සිදත් කුමාර
සභාපති
නියාගම ප්‍රාදේශිය සභාව
නියාගම, හල්ගස්වල

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - බද්දේගම ප්‍රාදේශීය සභාව

පළමු කොටස : 70.00	
රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්ය සාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ මතයක් ලැබී ඇත.පවතින අඩුපාඩු නිවැරදි කර ගනිමින් ඉදිරියේදී නිවැරදි විගණන මතයක් ලබා ගැනීමට කටයුතු කරමි.
ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	2024 වර්ෂයේ සිට යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි
ගල් බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	ගල් බොරළු ලේඛනය නිසි පරිදි පවත්වා ගෙන යාමට ඉදිරියේදී කටයුතු කරමි.
සභාව විසින් වියදම් සීමාවන් තීරණය කර. නගරාධිපතිවරයා / සභාපතිවරයා සහ නිළධාරීන් වෙත පැවරීමක් සිදු කර නොතිබුණි.	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි.
මුදල් රෙගුලාසි පරිදි ආයතනය තුල මූල්‍ය බලතළ පැවරීමක් සිදු කර නොතිබුණි.	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි.
මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුල සන්නිවේදනය කර නොතිබුණි.	මූල්‍ය බලතල පැවරීම සන්නිවේදනය කිරීමට කටයුතු කරමි.
මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම ප්‍රමාණවත් තරම් පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි.	සෑම ගණුදෙනුවක්ම ප්‍රමාණවත් තරම් පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා ඇත.

ලේඛ්‍ය සේනානායක
සභාපති
බද්දේගම ප්‍රාදේශීය සභාව

ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර නොතිබුණි	2020 – 2023 සිවි අවුරුදු සැලැස්ම පිළියෙල කර ඇත.
සංයුක්ත සැලස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර නොතිබුණි.	සිවි අවුරුදු සැලැස්මට අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට 2022/11/25 දින සභා සම්මත කර ඇත.
සංයුත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරමි
සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනයට අනුමත කර ගෙන නොතිබුණි.	ඉදිරියේදී අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයා නොතිබුණි..	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයන ලදී.
විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4 ක් වත් පවත්වා නොතිබුණි.	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි
පවරා නොගත් වත්කම් තිබුණි.	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	හඳුනාගත් අතිරික්තතා ඉන්වෙන්ට්‍රිගත කර ඇති අතර ඌනතා සම්බන්ධව නිර්දේශ ලබා ගෙන ඒ අනුව කටයුතු කරමි.
වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	දකුණු පළාත් ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි කර තිබූ අංක 53-5650 දරණ කැබ් රථය BPS/01/07/01/23 හා 2025/11/06 ලිපිය මගින් අපහරණය කිරීම සඳහා දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත භාර දී ඇත

ලලිත් සේනානායක
සභාපති
වද්දේගම ප්‍රාදේශීය සභාව

වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙන් අයකිරීම පහළ මට්ටමක විය. ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදු කර නොතිබුණි.	2023 වර්ෂයේ පැවති ආර්ථික අර්බුදමය තත්වය මත බිල්කළ ආදායමෙන් අයකිරීම පහළ මට්ටමක වූ අතර සාපේක්ෂව අයකිරීම් ඉහළ මට්ටමක පවතින බව හා බලපත්‍ර ගාස්තු අයවී ඇතිබව කාරුණික දැනුම් දෙමි.

දෙවන කොටස : 48.00	
ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වා ගෙන ගොස් නොතිබුණි.	මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වා ගෙන යනු ලබයි.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිළි හෝ ප්‍රසංශා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	පැමිණිළි හෝ ප්‍රසංශා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇත.
වරිපනම් කලාපය ඇතුලත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේදී කසල බදු අය කිරීම සඳහා කටයුතු කරමින් පවතී.
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබා ගත යුතු සියළු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	පරිසර බලපත්‍ර ලබා ගත යුතු ආයතන සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගන්නා ලෙස දැනුවත් කර ඇත.
මහ නගර සභා ආඥා පනතේ 272 වගන්තිය ,නගර සභා ආඥා පනතේ 157 වගන්තිය හා ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	පවතින අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමක් සිදු කර ඇත.
අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් ඉටුකල යුතුව තිබූ කර්තව්‍යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි	අතුරු ව්‍යවස්ථාව අනුව කළ යුතු කර්තව්‍යයන් ඉදිරි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට කටයුතු කරමි.

ලේඛ්‍ය සේනානායක
සභාපති
මද්දේගම ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථාව පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි
සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබූ බව පිළිගනිමි. 2023.11.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018(1) අනුව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තව දුරටත් අවශ්‍ය නොවන බව දන්වා ඇත.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාක්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු නම් කර නොතිබුණි.	ඉදිරියේදී නම් කිරීමට කටයුතු කරමි.
අනුමත සිමාව ඉක්මවා කාර්ය මණ්ඩල බදවා ගෙන තිබුණි.	සේවා අවශ්‍යතාවයන් මත සහ ප්‍රාදේශීය සභාව විසින් කාර්යයන් සහ කර්තව්‍යයන් සිදු කිරීමට අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව බදවා ගැනීම් සිදු කර ඇත. ඉදිරියේදී මෙම තනතුරු අනුමත කර ගැනීමට අවශ්‍ය පියවර ගනිමි.
සැලසුම් සහගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුනි.	සමස්ත කාර්ය මණ්ඩලය වෙත පුහුණු වීමේ අවස්ථාව ලබා දීමට කටයුතු කරමි
පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	ලැබෙන නියෝග/ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි.
2020.08.28 දිනැති අංක 02/ 2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කල යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්ය සාධක දර්ශක 03ක් හඳුනා ගෙන නොතිබුණි.	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි

ඔලිත් සේනානායක
සභාපති
මද්දේගම ප්‍රාදේශීය සභාව

වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාල නිළධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුනි.	වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකරන අදාල නිළධාරීන් සම්බන්ධව ඉදිරියේදී දැනුවත් කිරීමට කටයුතු කරමි.

සකස් කිරීම - අභ්‍යන්තර විගණන නිළධාරී, බද්දේගම ප්‍රාදේශීය සභාව

පරීක්ෂා කර ඉදිරිපත් කිරීම - ලේකම් , බද්දේගම ප්‍රාදේශීය සභාව

සභාපති ,
ප්‍රාදේශීය සභාව,
බද්දේගම.

ලලිත් සේනානායක
සභාපති
බද්දේගම ප්‍රාදේශීය සභාව